රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:- 310

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1985 ඔක්තෝබර් මස 30 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## රජයේ නිලධාරීන්ට වැටුප් ණය/අත්තිකාරම්.

1985.06.03 දිනැති අංක 293 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය යොමුවේ.

2. පහත සඳහන් කොටස 1:6 උප වගන්තියට එකතු කළ යුතුය.

ණය/අත්තිකාරම් මුදලේ ආපසු ගෙවීමට ඇති ශේෂය, " රජයේ නිලධාරීන්ට අත්තිකාරම්" ගිණුමට භර කරමින්, නිලධාරියා ලබා ගන්නා දෙපාර්තමේන්තුව ඔහු මුදා හරින දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුය.

3. සිංහල පෙළහි 3:14 වන උප වගන්තියට පහත සඳහන් වාක්‍යය එකතු කළයුතුය.

272 වැනි පොදු ආකෘති පත්‍රය : අනෙකුත් සියලු කටයුතු සඳහා

4. 9 වන වගන්තියට පහත සඳහන් උප වගන්තිය එකතු කළයුතුය.

9:5 වාර ගණන - වර්ෂ පහකට (5) වරක්

5. සිංහල පෙළහි 10:3 උප වගන්තියට පහත සඳහන් උප වගන්තිය එකතු කළයුතුය.

10:3:2 - ගෙවල් කුලිය සඳහා අත්තිකාරම් මුදලක් ගෙවීමට සිදුවන විට, එම මුදල තුන් මාසක අනුමත ගෙවල් කුලිය නොඉක්මවිය යුතුය.

6. පහත සඳහන් කොටස 10:6 වගන්තියට එකතු කළ යුතුය.

එක් ණයකට/අත්තිකාරමට වඩා ලබා ගෙන ඇති අයදුම්කරුවෙකු සම්බන්ධයෙන්, ආපසු අය කළ යුතු ගණන තීරණය කළ යුත්තේ මෙසේය.

යම් නිලධාරියෙකු එක් ගණයකට වඩා ණය ලබා ගෙන ඇතොත්, අලුතින් ණයක් ලබා ගැනීම සඳහා ඒ එක් එක් ගණවල ණය ආපසු ගෙවිය යුතු ආකාරය මෙසේ ගණන් බැලිය යුතුය.

නව ඒකාබද්ධ වැටුපෙහි මුල් සියයට පහ (5%) වැටුප් ණය සම්බන්ධයෙන් විය යුතුය. නව ඒකාබද්ධ වැටුපෙහි සියයට හතලිහ (40%) දක්වා ඊලඟ සෑම සියයට පහේ (5%) කොටසක් ) අනෙකුත් ගණවල ණය ආපසු ගෙවීම සඳහා; පහත සඳහන් ප්‍රමුඛත්වය ( ත බෙදාහැරිය යුතුය.

1. ප්‍රවාහන ණය
2. ණය ගැති භාවයෙන් මිදීමට ණය
3. දේපළ ණය

....../2

මෙයාකාරයෙන් වෙන්කර ගැනීමෙන් පසු, සම්පූර්ණ ශේෂය සාමාජිකයා අන්තිමවරට ලබා ගත් ණය වර්ගය පිරවුල් කිරීම සම්බන්ධයෙන් වූවක් ලෙස සැලකිය යුතුය.

මෙම චක්‍රලේඛයේ 3:4/උප වගන්තියේ සීමාවන්ට යටත්ව, සාමාජිකයෙකුට ඕනෑම ණය වර්ගයක් සම්බන්ධයෙන් වැඩි මුදලක් ආපසු ගෙවීම ඔහුගේ කැමැත්ත පරිදි කළ හැකිය.

අලුත් ණය මුදලක් අනුමත කිරීමේදී, ආපසු අය කිරීම පහත සඳහන් පරිදි නැවත නියම කළ යුතුය.

| | | | | |
|---|---|---|---|---|
| මසක නව ඒකාබද්ධ වැටුප හෝ රට අඩු - නව ඒකාබද්ධ වැටුපින් | | | | 5% |
| මසක නව ඒකාබද්ධ වැටුපට වැඩි සහ මාස දෙකක නව ඒකාබද්ධ වැටුප දක්වා | - | - | එම - | 7½% |
| මාස දෙකක නව ඒකාබද්ධ වැටුපට වැඩි සහ මාස තුනක නව ඒකාබද්ධ වැටුප දක්වා | - | - | එම - | 10% |

රුපියලකින් කොටසක් අය කර ගැනීමට සිදුවීම වැළැක්වීම සඳහා ආපසු අය කර ගන්නා මාසික වාරිකය ගණන් බැලීමේදී, වාරිකය ආසන්නම රුපියලට ගණන් බැලිය යුතුය. රුපියලකින් කොටසක් අයකර ගත යුතු නම්, එය පළමුවන වාරිකයෙන් අය කර ගත යුතුය.

7. පහත දැක්වෙන කොටස 11:12:4 [illegible] වගන්තියට එකතු කළ යුතුය. ආයතන සංග්‍රහයේ නව මුද්‍රණයේ මෙම පරිච්ඡේදයේ 3:1 උප වගන්තිය මෙසේ දැක්වේ.

3:1 මිලදී ගැනීමෙන්, බදු ගැනීමෙන්, තෑගි ලැබීමෙන්, උරුමයෙන්, දෑවැද්ද වශයෙන් හෝ අන්තිම කැමති පත්‍රයකින් හෝ හිමිවන ඉඩකඩම් හෝ ඉඩකඩම්වල කොටස් හෝ අත්කර ගැනීම සඳහා දිසාපතිගේ පූර්වානුමතිය අවශ්‍ය නොවේ. එහෙත් අත්කර ගන්නා හෝ අත්වන ඉඩකඩම් ගැන දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ මාර්ගයෙන්, ඉඩම පිහිටා ඇති දිස්ත්‍රික්කයේ දිසාපති වෙත තුන් මාසයක් ඇතුළත දැනුම් දිය යුතුය. එකී අත්කර ගැනීම් අපිසි යයි දිසාපතිට පෙනී ගියහොත් හෝ වෙනත් හේතුවක් නිසා එය නුසුදුසුයයි සැලකුවහොත් අවශ්‍ය පරිදි කටයුතු කිරීම සඳහා ඔහු ඒ කාරණය නිලධාරියා සේවය කරන අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කළ යුතුය.

8. ණය මුදලක්/අත්තිකාරමක් අනුමත කරන විට, ණය සහන සභා පණත යටතේ හෝ වෙනත් ක්‍රමයක් යටතේ හෝ ලබාගත් ණය/අත්තිකාරම් වල ශේෂයන්, ගෙවිය යුතු ණය/අත්තිකාරම් මුදලේ ප්‍රමාණය තීරණය කිරීමේදී ගණන් ගත යුතුය.

Siriwardhana
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.